# විවාහය හා බැඳී පවතින කාන්තාවගේ ජීවිතය ඒ ඒ සමාජ තුළ තවත් පීඩනයට පත් වන ආකාරය පිළිබඳ 'යෝගායෝග්' සහ 'එමා බෝවාරි' නවකතා ද්විත්වය ඇසුරින් කෙරෙන විමර්ශනයක්

*වේරගොඩ, ඩබ්. ඒ. ඩබ්. එස්.* [1]

රබීන්ද්‍රනාථ් ඨාකූර් විසින් රචිත **'යෝගායෝග්'** නවකතාවේ සහ ගුස්ටාව් ෆ්ලෝබෙයාර්ගේ **'එමා බෝවාරි'** නවකතාවේ නිරූපණය වන කාන්තාව, එකිනෙකට සහමුලින්ම වෙනස් සමාජ පද්ධතීන් දෙකක නමුත් මනෝවිද්‍යාත්මකව එකිනෙකට සම්බන්ධ වූ පුරුකක් ලෙස හඳුනාගත හැකිය. **'කුමුදූනිය'** සහ **'එමා'** යන චරිත දෙක විශ්ලේෂණයේදී මෙම කාන්තාවන් දෙදෙනාම මුහුණ දෙන්නේ එකම මානසික විප්ලවයකට වුවද ඔවුන් එම පීඩනය දරන ආකාරය වෙනස්ය. **'වෛවාහකත්වය'** වූ කලි තවමත් මිනිසාගේ අසන්තුෂ්ටියේ හා පරිහානියේ ඉතා බියජනක මූලාශ්‍රයන්ගෙන් එකක් ලෙස පවතී. මෙයට හේතුව වන්නේ කාන්තාව තුළ පවතින ශක්ති පදාර්ථය හඳුනා ගැනීමට ස්වාමිපුරුෂයා තුළ පවතින **'නොහැකියාවයි'**. භාරතීය නවකතාකරුවෙකු වූ ඨාකූරයන් **'යෝගායෝග්'** නවකථාවෙන් නිරූපණය කරන මෙම සංකල්පය බටහිර නවකතාකරුවෙකු වූ ෆ්ලෝබෙයාර් සනාථ කරනු ලබයි. එහිදී **'කුමුදූනී'** සහ **'මධුසූදන්'** අතරත් **'එමා'** සහ **'චාල්ස්'** අතරත් පැවති විවාහ සම්බන්ධතාවෙහි කාන්තාව දැඩි පීඩනයට පත් වන ආකාරය කැපී පෙනේ. ඒ අනුව මෙහිදී අරමුණු කොට ගන්නේ විවාහය හා බැඳී තිබෙන කාන්තාවගේ ජීවිතය සමාජයෙහිදී තවත් පීඩනයට පත් වන ආකාරය මෙම නවකතා ද්විත්වය තුළින් නිරූපණය වන බව නිගමනය කිරීමය.

ප්‍රමුඛ පදඃ එමා බෝවාරි, කාන්තාව, යෝගායෝග්, විවාහය, සමාජය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ), සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*subaweragoda@gmail.com*